සියලුම හිමිකම් ඇවිරිණි/ KOg; gjpg;GupikAilaJ / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
kj;jpa khfhz fy;tpj; jpizf;fsk;
Department of Education Central Province

| 11 ශ්‍රේණිය | අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2018 | 84 | S | I |
|---|---|---|---|---|

## ශිල්ප කලා I

**කාලය පැය එකයි**


**සැලකිය යුතුයි:**

- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති පිළිතුරු අතරින් වඩා නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර සපයන්න.

01. ශ්‍රී ලාංකේය සංස්කෘතික අංගයන් වන ශාන්ති කර්ම, වන්නම් වැනි ජනකලාවන් අයත් වන ජන කලා වර්ගය වන්නේ,
1. විදග්ධ කලා 2. ශ්‍රව්‍ය දෘෂ්‍ය කලා 3. දෘෂ්‍ය කලා 4. ශ්‍රව්‍ය කලා

02. කාර්මික ඇඳීමේදී ඡේදනය කළ යුතු ස්ථාන දැක්වීම සඳහා භාවිත වන රේඛා වර්ගය වන්නේ,
1. දෙකෙළවර ඝන දාම රේඛා 2. ඝන අඛණ්ඩ රේඛා
3. කඩ රේඛා 4. සිහින් අඛණ්ඩ රේඛා

03. වෘත්තයක් ඕනෑම කොටස් ගණනාව බෙදීමේ එක් ක්‍රම ශිල්පයක් පහත දැක්වේ. එම ජ්‍යාමිතික නිර්මාණය ඇඳීම සඳහා භාවිතා වන ජ්‍යාමිතික උපකරන කට්ටලය වන්නේ,
1. කෝන්මානය, කවකටුව, පැන්සල, කෝදුව
2. කවකටුව, බෙදුම් කටුව, පැන්සල, කෝදුව
3. පැන්සල, කෝදුව, කෝණමානය, බෙදුම් කටුව
4. කවකටුව, කෝදුව, විහිත චතුරස්‍රය, පැන්සල




04. සරල රේඛාවක් සමාන කොටස් ගණනකට බෙදීමේදී භාවිතවන ජ්‍යාමිතික උපකරන කට්ටලය වන්නේ,
1. කෝදුව, පැන්සල, කවකටුව, විහිත චතුරස්‍රය
2. කෝණමානය, පැන්සල, කවකටුව, කෝදුව
3. බෙදුම් කටුව, කෝණමානය, පැන්සල, කෝදුව
4. බෙදුම් කටුව, කවකටුව, ටී රූල, කෝදුව


05. පහත සඳහන් නිර්මාණ අතුරින් කල ජ්‍යාමිතියට අයත් රූපය වන්නේ,

1. 
2. 
3. 
4. 

06. කෝණයේ අගය $90^0$ වැඩි අගයක් ගන්නේ නම් එම කෝණ හඳුන්වන නාමය
1. සරල කෝණ 2. මහා කෝණ 3. ඍජු කෝණ 4. පරාවර්ථන කෝණ

07. පාද හා කෝණ සමානය, විකර්ණ එකිනෙක සමානය, ශීර්ෂ කෝණ ද සමච්ඡේදනය වේ. සම්මුඛ පාද සමාන්තර වේ. එම චතුරස්‍රය හඳුන්වන නාමය
1. ඍජුකෝණාස්‍රය 2. ආයත චතුරස්‍රය 3. සමචතුරස්‍රය 4. සමාන්තරාස්‍රය

08. පහත සඳහන් වෘත්තයෙහි A සහ B වශයෙන් සලකුණු කර ඇති කොටස් හඳුන්වන නාමය වන්නේ,
1. A - පරිධිය, B - ජ්‍යාය
2. A - විෂ්කම්භය, B - පරිධිය
3. A - ජ්‍යාය, B - චාපය
4. A - අභිලම්භය, B - ස්පර්ශකය




09. ඉලිප්සය ඇඳීමට යොදා ගන්නා ප්‍රධාන ක්‍රම,
1. 3 කි. 2. 2 කි. 3. 4 කි. 4. 6 කි.

10. පාද තුනක් හෝ ඊට වැඩි ගණනකින් සමන්විත වූ සංවෘත තල රූප හඳුන්වන නාමය,
1. ඝනවස්තු 2. චතුරස්‍ර 3. විකසනය 4. බහු අස්‍ර

11. රෙදි පිළි පින්තාරු කිරීමේදී වර්ණවල පාරදෘශ්‍ය බව ඇති කරලීමට එක් කරන මාධ්‍යයක් වන්නේ,
1. දිය සායම් 2. ජලය 3. තෙල් සායම් 4. බයින්ඩර් ගම්

12. රෙදි පිළි අලංකරණයේදී භාවිතයට ගන්නා පින්සල් අතර පින්සල්හි කෙඳි කොටස අග තුඩක් ආකාරයට නිමවා ඇත්තේ,
1. රවුම් පින්සල් 2. පැතලි පින්සල් 3. සියුම් නිමා පින්සල් 4. විශාල පින්සල්

13. රෙදි පිළි අලංකාරයේදී භාවිතයට ගනු ලබන ද්විතියික වර්ණයක් වන්නේ,
1. කොළ 2. නිල් 3. රතු රඹ 4. කහ

14. රෙදි පිළි පෙර පිරියම් කිරීමේදී ස්වභාවික අමුරෙදිවල පවත්හා දුඹුරු පැහැය ඉවත් කර සුදු පැහැය ලබා ගැනීමට සිදු කරන රසායනික ක්‍රියාවලිය
1. කාබනීකරණය 2. විරංජනය 3. මලහරණය 4. මැලියම්හරණය

15. රෙදි පිළි අලංකාරණයේදී මෝස්තරවල ගැඹුර හා ත්‍රිමාණත්වය ගොඩනැගීමට භාවිත වන ක්‍රමයකි,
1. අඳුරුකරණය 2. යටි ආලේපය 3. සේදුම 4. අධි ආලෝකකරණය

16. චිත්‍ර ශිල්පයේ හැකියාව අඩු අයකුට වුවද ඉතා පහසුවෙන් සිදු කළ හැකි රෙදි පිළි අලංකාරණ ක්‍රමය වන්නේ,
1. අතින් පින්තාරු ත්‍රමය 2. සිදුරු තහඩු පත් මුද්‍රණය
3. තිර රාමු මුද්‍රණය 4. තාප බන්ධිතක්‍රමය

17. රෙදි පිළි අලංකරණ ක්‍රමයක් වන තිර රාමු මුද්‍රණ ක්‍රමයේ පියවර පහත දැක්වේ.
A - සැකසු තිර රාමුව ඒ මත තබා සායම් දැමීම
B - රෙදි තැබැල්ල මුද්‍රණ තලය මත රඳවා ගැනීම
C - තිරය මත මෝස්තරය පිටපත් කිරීම
D - මුද්‍රණය නොවිය යුතු කොටස්වල වාර්නිෂ් ආලේප කිරීම
E - ස්ක්‍යුජය මගින් සායම් එහා මෙහා තැවරීම





එම පියවර අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,
1. B, A, C, D, E 2. C, B, D, A, E 3. C, D, B, A, E 4. C, B, A, D, E

18. බතික් නිර්මාණ ක්‍රියාවලියේදී මෝස්තරයට යොදනු ලබන ඉටි ආලේපන වීදුරුතහඩුවක් සේ නොබිඳෙන සුළු බවක් ඇති කිරීමට
1. මී ඉටි ප්‍රමාණය වැඩි කළ යුතුය 2. මී ඉටි ප්‍රමාණය අඩු කළ යුතුය
3. රට දුම්මල ප්‍රමාණය අඩු කළ යුතුය 4. රට දුම්මල ප්‍රමාණය වැඩි කළ යුතුය

19. පහත දැක්වෙන්නේ රිබන් ආධාරයෙන් මසා ගත් මෝස්තරයකි. එම මෝස්තරය මැසීමට භාවිත කළ මැහුම් ක්‍රමය වන්නේ,
1. ලේසි ඩේසි මැස්ම
2. ලූප් මැස්ම
3. කෙලින් මැස්ම
4. රිබන් මැස්ම



20. මැටි භාණ්ඩ අලංකරණයේදී කඩදාසි ජලයේ පොඟවා ගැනීම තුළින් විචිත්‍රවත් රටා මතු කර ගැනීම සිදු කිරීමේ මැටි භාණ්ඩ අලංකරණ ක්‍රමය
1. කොලාජ් ඉමය 2. පල්ප් ඉමය 3. ඩෙකෝපාජ් ස්‍රමය 4. මාබල් ක්‍රමය


21. පහත දැක්වෙන වියමන් රටා අතුරින් සරල හීරි වියමන් රටාව තෝරන්න.
1. 
2. 
3. 
4. 

22. අත් යන්ත්‍රයෙන් රෙදි විවීමේදී භාවිත කරන මල් චක්‍රය, එතුම් රෝදය, එතුම් කුර, නූල් කුරු යන උපකරණ කට්ටලය අවශ්‍ය වන්නේ,
1. නූල් හැදය දිග් ගසා ගැනීමටය 2. නූල් හැදය යන්ත්‍රගත කිරීමටය
3. නූල් ඔතා ගැනීම සඳහාය 4. නූල් ඒකක වෙන් කර ගැනීමට

23. නූල් හැදයක් සකස් කිරීමේදී සීරු දැම්ම සඳහා භාවිත කරන උපකරණය වන්නේ,
1. නූල් බෙරය 2. නූල් දික් ගසන ලෑල්ල 3. දිග් නූල් කුරු රාක්කය 4. නූල් බෙත්ම

24. විවීම් තාක්‍ෂණයේදී අත්‍යන්ත්‍රවලට පනාව නැමැති උපාංගය එක් කිරීමෙන් අපේක්‍ෂා කරන කාර්යය වන්නේ,
1. රටාවකට අනුව නූල් ඇද ගැනීමට 2. හරස්නූල තද කර ගැනීමට
3. නූල් දවටා ගැනීමට 4. නූල් එතිම සඳහාය

25. විවීම් තාක්‍ෂණයේදී භාවිත කරනු ලබන අත්‍යන්ත්‍රයක උපාංගයන් පහත දැක්වේ. එම උපාංගය හඳුන්වන නාමය වන්නේ,



1. පනාව 2. අළුව
3. පුඩුවැල් පේලි 4. නූල් බෙත්ම

26. අත් පිස්නා හැදයක් වියා ගැනිම සඳහා අංක $2/40^{s}$ නූල් භාවිත කරන ලදී. නූල් කිලෝග්‍රෑම් දෙකකට අඩංගු නූල් කැරලි සංඛ්‍යාව වන්නේ,
1. 20 කි. 2. 40 කි. 3. 80 කි. 4. 160කි

27. සෙන්ටිමිටර එකකට නූල් 40 බැගින් යොදා අංක $2/20^{s}$ දෙපට නූල් භාවිත කර 50 m ක් දිග නූල් හැදයක් සුදානම් කර ඇත. එහි පළල 30cm ක් නම් හැදයට අවශ්‍ය නූල් පොටවල් ගණන වන්නේ,
1. 40 x 30 - 1200 2. 20 x 40 - 800 3. 40 x 50 - 2000 4. 50 x 20 - 1000

28. තුවා හැදයක් විවීමට අංක $2/40^{s}$ නූල් භාවිත කරන ලදී. තුවා විවීම සඳහා නූල් 4 kg ක් වැයවිය. එහි අඩංගු නූල් කැරලි සංඛ්‍යාව
1. $\frac{40}{4}$ x 4 = 40 2. $\frac{40}{2}$ x 2 = 40 3. $\frac{40}{4}$ x 2 = 20 4. $\frac{40}{2}$ x 4 = 80

29. නූල් හැදයක දිග යාර 60 කි. පළල 30 cm කි. අංක $2/32^{s}$ දරණ නූල් 24 ක් එක් සෙන්ටිමිටරයක් තුළ වේ. එම හැදයේ ඇති දික් නූල් පොටවල් ගණන වන්නේ,
1. 700 කි. 2. 720 කි. 3. 800 කි. 4. 820 කි.

30. භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා මැටිවල අන්තර් ගත වී ඇති මූලද්‍රව්‍ය අඩංගු පිළිතුර වන්නේ,
1. ඇලුමිනා සිලිකේට් කොටස් 1, සිලිකන් ඩයොක්සයිඩ් කොටස් 2, ජලය කොටස් 2
2. ඇලුමිනියම් ඔක්සයිඩ් කොටස් 2, සිලිකන් ඩයොක්සයිඩ් කොටස් 2, ජලය කොටස් 1
3. ඇලුමිනියම් ඔක්සයිඩ් කොටස් 1, සිලිකන් ඩයොක්සයිඩ් කොටස් 2, ජලය කොටස් 2
4. ඇලුමිනා සිලිකේට් කොටස් 1, සිලිකන් ඩයොක්සසිඩ් කොටස් 2, ජලය කොටස් 2

31. භාණ්ඩ නිෂ්පාදනය සඳහා භාවිතයට ගන්නා කෙඔලින් මැටි හඳුනාගත හැකි සාධක වන්නේ,
1. පිළිස්සීමට පෙර දුඹුරු වර්ණයන් යුක්ත විම හා පිළිස්සීමෙන් පසු සුදු පැහැති විම
2. පිළිස්සීමට පෙර සහ පිළිස්සීමෙන් පසු පැහැදිලි සුදු පැහැති බවක් ඇත.
3. පිළිස්සීමට පෙර අළුපැහැති විම හා පිළිස්සීමෙන් පසු සුදු පැහැති වීම.
4. පිළිස්සීමට පෙර සුදු පැහැති විම හා පිළිස්සීමෙන් පසු විවිධ වර්ණවලින් යුක්තවිම.

32. පාසලට ඇතුල්වන ගේට්ටුව අසල තාප්පයේ රූඩවිමට මැටි මාධ්‍යයෙන් සිදු කිරීමට වඩාත් සුදුසු ක්‍රමය වන්නේ,
1. මැටි දරණු වලින් තැනූ ත්‍රිමාන හැඩැති නිර්මාණයකි.
2. සතපෝරුවේ ඉදිකරගත් විවිධ ප්‍රමාණයේ භාණ්ඩයන්ය.
3. මැටි තහඩු භාවිතයෙන් කැටයම් ක්‍රම යොදා සකස් කළ නිර්මාණයකි
4. අතින් ඇඹීමේ ක්‍රමය භාවිත කර සකස් කර ගත් රූප ඇතුලත් නිර්මාණයයි.

33. මැටි භාණ්ඩ නිෂ්පාදනය සිදු කරන ක්‍රමයක් වන සකපෝරුවෙන් භාණ්ඩ ඉදි කිරීමේ පළමු පියවර වන්නේ,
1. මැටි පිඩ සකපෝරුව මත සවි කිරීම 2. මැටි පිඬ මධ්‍යගත කර ගැනීම
3. මැටි පිඬ විවෘත කිරීම 4. මැටි පිඬේ වයනය ලබා ගැනීම

34. භාණ්ඩ නිෂ්පාදනයට යොදා ගැනෙන්නේ පාෂාණ ජීර්ණය විමේදි සෑදෙන 0.002 mm වඩා කුඩා කලිලමය මැටි අංශු හඳුන්වන රසායනික නාමය
1. සිලිකන් ඩයොක්සයිඩ් 2. ඇලුමිනා සිලිකේට් 3. ඇලුමිනියම් ඔක්සයිඩ් 4. සෝඩියම් සිලිකේට්

35. ප්‍රමිතියෙන් යුතු භාණ්ඩයක් නිර්මාණය කර ගැනීමට මැටිවල තිබිය යුතු භෞතික රසායනික ගුණ වන්නේ,
1. සුවිකාර්යතාවය, සවිවරතාවය, වර්ණය, හැකිලීම
2. ඝනත්වය, භංගුරතාව, සක්‍යතාව, වර්ණය
3. තන්‍යතාව, නම්‍යතාව, භංගුරතාව, වර්ණය
4. ශක්‍යතාව, අනම්‍යතාව, ඝනත්වය, වර්ණය

36. භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා සෙන්ටිග්‍රේඩ් $1650^0$ පමණ උෂ්ණත්වයට පිළිස්සීමේ හැකියාව ඇති මැටි වර්ගයක් වනුයේ,
1. බෝල මැටි 2. රතු මැටි 3. කෙඹලින් මැටි 4. නොවිරෙන මැටි

37. මැටි භාණ්ඩ පිළිස්සීම සඳහා යොදාගන්නා පෝරණු අතරින් පිළිස්සුම් කලාප කිහිපයකින් යුත් පෝරණු වර්ගය වන්නේ,
1. සංතතික උමං උඳුන් 2. පැතිදහර පෝරණු 3. උඩු දහර පෝරණු 4. සංතතික උඳුන්

38. මැටි භාණ්ඩ පිළිස්සීමේදී ද්විතියික පිළිස්සීම සිදුකරන භාණ්ඩ වර්ගය වන්නේ,
1. ගුරුලේත්තු 2. විසිතුරු මල් බඳුන් 3. පෝසිලේන් භාණ්ඩ 4. ටෙරාකොටා බඳුන්

39. උද්‍යාන අලංකරණ මූර්ති නිර්මාණයන් සඳහා අතීත මූර්ති ශිල්පීන් භාවිත කර ඇති ද්‍රව්‍යයක් වන්නේ,
1. සිමෙන්ති 2. ෆයිබර් 3. ජලාස්ටර් ඔෆ් පැරිස් 4. කිරි ගරුඬ

40. උද්‍යාන අලංකරණ කෘති නිර්මාණයේදී අනුගමනය කරනු ලබන ක්‍රම වන්නේ,
1. මූර්ති හා මියුරල් 2. මූර්ති හා කැටයම්
3. පූර්ණ උන්නත හා අල්ප උන්නත 4. කැටයම් හා පූර්ණ උන්නත

* * * * *

සියලුම හිමිකම් ඇවිරිණි/ KOg; gjpg;GupikAilaJ / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
kj;jpa khfhz fy;tpj; jpizf;fsk;
Department of Education Central Province

11 ශ්‍රේණිය අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2018 | 84 | S | II

ශිල්ප කලා II

කාලය පැය දෙකයි

සැලකිය යුතුයි:

- පළමුවැනි ප්‍රශ්නද තෝරාගත් තවත් ප්‍රශ්න හතරක්ද ඇතුල්ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. "නව නිපැයුම් තුළින් ඉදිරි ලොවක්" යන තේමාව යටතේ වෙළඳ ප්‍රදර්ශනයක් හා සංස්කෘතික ප්‍රදර්ශනයක් පැවැත්වීමට සංස්කෘතික අමාත්‍යාංශය කටයුතු කර ඇත.

1. මෙම ප්‍රදර්ශනය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට සුදුසු පෝස්ටරයක් නිර්මාණය කරන්න.
2. මෙම ප්‍රදර්ශන කාර්ය මණ්ඩලයට පැළඳීම සඳහා සුදුසු ලාංඡනයක් ඇඳ දක්වන්න.
3. මෙම ප්‍රදර්ශනය නැරබීම සඳහා සහභාගිවන පාසල් සිසුන්ට අත් පළඳනාවන් ලබා දීමට සංස්කෘතික අමාත්‍යාංශය තිරණය කර ඇත එම අත්පළඳනාවට සුදුසු ආකෘතියක් ඇඳ දක්වන්න.
4. උත්සව ශාලාවේ පිවිසුම් දොරටුව අසල එළීමට සුදුසු කලාලයක් සඳහා ගැළපෙන ජ්‍යාමිතික හැඩතලයක් ඇඳ දක්වන්න.
5. ප්‍රදර්ශන කුටියේ තැබිය හැකි ආකාරයේ විසිතුරු මැටි භාණ්ඩ අලංකාර කිරීමට යොදා ගත හැකි අලංකරණ ක්‍රම දෙකක් නම් කරන්න.
6. උත්සවයේ නිවේදන පුරුව අලංකාර කිරීමට සුදුසු සැරසිල්ලක් ඇඳ දක්වන්න.
7. ප්‍රදර්ශනය සඳහා පන් වලින් වියු කාන්තා අත්බෑගද තැබිමට නියමිතය. එම අත්බෑගයක් නිර්මාණය කිරීම සඳහා දික් දාර වියමන් රටාව ඇතුලත් නිර්මාණයක් ඇඳ දක්වන්න.
8. ප්‍රදර්ශනය නැරඩීමට පැමිණෙන ආරාධිතයන්ට සංග්‍රග කිරීමට සූදානම් කරන කේක් සඳහාවූ ඇසුරුම සෘජුකෝණාසුාකාර පැති සහිත පෙට්ටියකි. එහි විකසනය ඇඳ දක්වන්න.
9. 10% ක ලාභයක් ඇතිවන සේ භාණ්ඩවල මිල නියම කිරීමට උපදේස ලැබී ඇත. අත්බෑගයක නිෂ්පාදන වියදම රු. 150 නම් වෙළඳපල සඳහා වන මිල නියම කරන්න.
10. ප්‍රදර්ශනය සඳහා නිර්මාණ ඉදිරිපත් කරන්නන්ට ජයසංකේතයන් පිරිනැමීමට නියමිතය. එම ජය සංකේතය සඳහා සුදුසු ආකෘතියක් ඇඳ දක්වන්න.

02. ඇඳුම් පැළඳුම් මෙන්ම ගෘහිය රෙදි පිළි විසිතුරුකරණයේදී රිබන් එම්බ්‍රොයිඩර් කලාවට සුවිශේෂි ස්ථානයක් හිමිව ඇත.
1. රිබන් මෝස්තර මැසීමට යොදා ගන්නා මැහුම් ක්‍රම දෙකක් නම් කරන්න.
2. ඉන් එක් මැහුම් ක්‍රමයක් භාවිත කර සකස් කරගන්නා මෝස්කරයක් ඇඳ දක්වන්න.
3. රිබන් මෝස්තර මැසීමේදි සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් විස්තර කරන්න.

03. රෙදි නිෂ්පාදනයේදි යොදා ගන්නා යන්ත්‍ර ඒවායේ ක්‍රියාකාරිත්වය අනුව විවිධ වේ.
1. මහා පරිමාණ කර්මාන්තශාලාවල භාවිතවන බලවේග යන්ත්‍ර මගින් රෙදිවිවීමේ වාසි දෙකක් ලියන්න.
2. නූල් ඇදිම සඳහා භාවිතයට ගන්නා අත්යන්ත්‍රයට සවිකරණ උපාංග තුනක් නම් කරන්න.
3. අත් යන්ත්‍රයක හරස් නූල එහා මෙගා ගෙනයෑම සඳහා භාවිත කරන නඩාව ඇඳ දක්වන්න.

04. අත්යන්ත්‍රයක් ආධාරයෙන් අත් පිස්නා විවීම සඳහා සකස් කළ නුල් හැදයක තොරතුරු පහත ඇක්වේ.

හැදයේ දිග - 100m
හැදයේ පළල - 20 cm
එක් සෙන්ටිමීටරයක දිග් නූල් පොටවල් ගණන - 60
නූල් නොම්මරය - $2/40^{s}$

1. රළ හීරි වියමන ඇඳ දක්වන්න
2. අත් පිස්නා විවීමට සුදුසු වියමන් රටා දෙකක් නම් කරන්න
3. හැදය විවීමට අවශ්‍ය $2/40^{s}$ නූල් ප්‍රමාණය ගණනය කරන්න.

05. සායම් ආලේපනය හා සායම් පෙවීමතුළින් රෙදි පිළි අලංකරණය සිදු කරනු ලබයි.
1. බතික් නිර්මාණ ක්‍රියාවලියේදී මෝස්තර මැවීම සඳහා ඉටි තවරන ක්‍රම දෙකක් නම් කරන්න.
2. අච්චු මුද්‍රණ ක්‍රමයේ වාසි දෙකක් නම් කර අච්චු මුද්‍රණ ක්‍රමය සඳහා සුදුසු මෝස්තරයක් ඇඳ දක්වන්න.
3. තාප බන්ධින ක්‍රමය උපයෝගි කර ගනිමින් අත් පිස්නාවක් අලංකාර කර ගන්නා ආකාරය ලියා දක්වන්න.

06. පොළොවෙන් ලබා ගැන්නා මැටි විවිධ අයුරින් මැටි භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොදා ගැනේ,
1. මැටි පදම් කිරීමේ තාක්ෂණික ක්‍රම දෙක නම් කරන්න.
2. මැටි භාණ්ඩ නිෂ්පාදන ක්‍රම හතරක් නම් කරන්න.
3. මැටි තහඩුවකට සුදුසු සිතුවමක් ඇ දක්වන්න.

07. ගෘහ නිර්මාණ ක්ෂත්‍රයේදී උද්‍යාන අලංකරණය පිළිබ,ව දැඩි අවධානයක් යොමු කරයි.
1. උද්‍යාන මූර්ති නිර්මාණය සඳහා භාවිත කරන මාධ්‍ය දෙකක් නම් කරන්න.
2. උද්‍යාන අලංකරණයේ සැලකිලිමත් විය යුතු උද්‍යාන විද්‍යා මූලධර්ම දෙකක් නම් කර ඉන් එක් මූලධර්මයක් පිළිබඳ විස්තර කරන්න.
3. මැටි භාණ්ඩ අලංකරණය කර ගත හැකි ක්‍රම දෙකක් නම් කර ඉන් එක් ක්‍රමයක් මගින් භාණ්ඩයක් අලංකාර කර ගන්නා ආකාරය කෙටියෙන් ලියන්න.

* * * * *

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ශිල්ප කලා - 11 ශ්‍රේණිය
පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | |
|---|---|---|---|
| 01. 2 | 11. 2 | 21. 1 | 31. 2 |
| 02. 1 | 12. 3 | 22. 3 | 32. 3 |
| 03. 4 | 13. 1 | 23. 4 | 33. 1 |
| 04. 1 | 14. 2 | 24. 2 | 34. 2 |
| 05. 3 | 15. 1 | 25. 3 | 35. 1 |
| 06. 2 | 16. 4 | 26. 2 | 36. 4 |
| 07. 3 | 17. 3 | 27. 1 | 37. 1 |
| 08. 4 | 18. 1 | 28. 4 | 38. 3 |
| 09. 1 | 19. 1 | 29. 2 | 39. 4 |
| 10. 4 | 20. 2 | 30. 3 | 40. 2 (1x40= 40) |

II පත්‍රය

01. 2 x 10 - 20

02. 1. 2
    2. 4
    3. 4

03. 1. 2
    2. 4
    3. 4

04. 1. 4
    2. 2
    3. 4

05. 1. 2
    2. 4
    3. 4

06. 1. 2
    2. 4
    3. 4

07. 1. 2
    2. 4
    3. 4

(ලකුණු 60 යි)

* * * * *


LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440